| 52. | යෝගට් නිෂ්පාදනය | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 53. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 54. | තේ කුඩු පැකට් කර විකිණීම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 55. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 56. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 57. | කොන්ක්‍රීට් වැඩපලක් හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන වැඩපොළක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 58. | වානේ ගෘහ භාණ්ඩ භාණ්ඩ නිශ්පාදන වැඩපොළක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 59. | විකිණීම සඳහා සුරතල් මසුන් ඇතිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 60. | බිම්මල් වගාකිරීම හා ඇසුරුම් කිරීම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 61. | රසායනාගාර පහසුකම් සපයන ස්ථාන | 500 | 00 | 750 | 00 | 1000 | 00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 62. | දන්ත චිකිත්සගාරයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 63. | රූපවාහිණි යන්ත්‍ර අලුත්වැඩියා කිරිමේ ස්ථානයක් පවත්වගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 64. | පාපැදි අමතර කොටස් විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 00 | 750 | 00 | 1000 | 00 |
| 65. | දර විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 0 | 750 | 00 | 1000 | 00 |
| 66. | ඉහතින් සඳහන් නොවන වෙනත් බලපත්‍ර ලබාගත යුතු යැයි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන වෙළඳ ව්‍යාපාර | | | | | | |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

## 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව , හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණිමෙන් ලත් මුදලින් සීයයට එකක (1%) බද්ධක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ  හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් හපුතලේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

## 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව , හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණිමෙන් ලත් මුදලින් සියයට එකක (1%) බද්ධක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ  හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් හපුතලේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

**2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා 153 වන වගන්තියේ (1) උප වගන්තියෙන් හපුතලේ ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හපුතලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/10 ට අඩු වන්නේ නම්,

එකී ඉඩම , සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක බද්දක් ඉඩම් අයිතිකරුගෙන් පනවා අය කිරීමට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

**2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා 153 වන වගන්තියේ (1) උප වගන්තියෙන් හපුතලේ ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හපුතලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/10 ට අඩු වන්නේ නම්,

එකී ඉඩම , සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම්

අගයෙන් සියයට දෙකක බද්දක් ඉඩම් අයිතිකරුගෙන් පනවා අය කිරීමට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

**2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122 හා 126 (ii) උප වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2 හා 2013.06.28 දින අංක 1816 /43 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 17 වන කොටසේ විධිවිධාන ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට , මාර්ගයකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ගාස්තුවක්, 2023 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| **අනු අංකය** | **දැන්වීම් පුවරුවේ ස්වභාවය** | **ගාස්තුව රුපියල් ශත ( වර්ග අඩියකට )** | | |
|---|---|---|---|---|
| | | **මාස 03කට අඩු** | **මාස 03 හෝ මාස 06 ත් අතර** | **වසරක්** |
| 01 | කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 40.00 | 60.00 | 100.00 |
| 02 | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 30.00 | 50.00 | 80.00 |
| 03 | තහඩු හෝ දැව මඟින් ප්‍රදර්ශණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 30.00 | 50.00 | 80.00 |
| 04 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 60.00 | 80.00 | 120.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 80.00 | - | - |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 75.00 | 100.00 | 125.00 |
| 07 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | - | - | 200.00 |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. එම්. විමලසිරි මහතා

විවාද

**2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122 හා 126 (ii) උප වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2 හා 2013.06.28 දින අංක 1816 /43 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 17 වන කොටසේ විධිවිධාන ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට , මාර්ගයකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ගාස්තුවක්, 2023 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛනය**

| අනු අංකය | දැන්විම් පුවරුවේ ස්වභාවය | ගාස්තුව රුපියල් ශත ( වර්ග අඩියකට ) | | |
|---|---|---|---|---|
| | | **මාස 03කට අඩු** | **මාස 03 හෝ මාස 06 ත් අතර** | **වසරක්** |
| 01 | කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්විම් | 40.00 | 60.00 | 100.00 |
| 02 | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 30.00 | 50.00 | 80.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | තහඩු හෝ දැව මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 30.00 | 50.00 | 80.00 |
| 04 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 60.00 | 80.00 | 120.00 |
| 05 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 80.00 | - | - |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 75.00 | 100.00 | 125.00 |
| 07 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | - | - | 200.00 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

**2023 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තම සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු ගෙවීම එහි II තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2023 වර්ෂයට අයකළ යුතු බවටත් එකී වාහන හා සත්ත්ව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වූ මෙම බද්ද හපුතල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නී ය.

**උපලේඛන**

| I වන තීරුව | II තීරුව (රු. ශත) |
|---|---|
| 1. මෝටර් රථයක් , මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයන්, කරත්තයක්, ජින් රික්ෂෝවක් , බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා<br>(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්,<br>(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේම නම්, | <br><br>18.00<br>4.00 |
| 3. සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 4. සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| 5. සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| 6. සෑම අශ්වයෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| 7. සෑම ඇතෙකු සඳහා | 50.00 |

2. සෑම විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

**2023 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තම සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු ගෙවීම එහි II තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2023 වර්ෂයට අයකළ යුතු බවටත් එකී වාහන හා සත්ත්ව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වූ මෙම බද්ද හපුතල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛන**

| I වන තීරුව | II තීරුව (රු. ශත) |
|---|---|
| 1. මෝටර් රථයක් , මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයන්, කරත්තයක්, ජින් රික්ෂෝවක් , බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |

| | |
|---|---|
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා<br>(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්,<br>(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේම නම්, | <br><br>18.00<br>4.00 |
| 3. සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 4. සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| 5. සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| 6. සෑම අශ්වයෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| 7. සෑම ඇතෙකු සඳහා | 50.00 |

2. සෑම විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 11**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

**2023 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ සඳහා 2023 වර්ෂයට අදාලව හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සඳහා එකි උපලේඛනයේ ( ii ) තිරුවේ අනුප්‍රමාණික ගාස්තුවක් අය කිරීම නියම කළ යුතු බවට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උප ලේඛන**

| **අනු අංකය** | **විස්තරය** | **ii තීරුව (රු. ශත)** |
|---|---|---|
| 01 | **ප්‍රධාන ක්‍රීඩාංගණය වෙන් කිරිම**<br>i- වාණිජ කටයුතු සඳහා දිනකට<br>ii- පොදු කටයුතු<br>iii- පාසැල් හෝ ළදරු පාසැල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම<br>**සභාව සතු වෙනත් ක්‍රීඩාංගණ වෙන් කිරිම**<br>iv- වාණිජ කටයුතු සඳහා දිනකට<br>v- පොදු කටයුතු<br>vi- පාසැල් හෝ ළදරු පාසැල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම | <br>10,000.00<br>2000.00<br>-<br><br><br>2500.00<br>1000.00<br>- |

| | | |
|---|---|---|
| 02 | **ජල බවුසරය**<br>i- ජල බවුසරය නගර සීමාව තුළ ජලය රහිතව (දිනකට)<br>ii- ජල බවුසරය නගර සිමාවෙන් පිටත<br>iii- නාගරික බල ප්‍රදේශයට අයත් නොවේ නම් දුර ප්‍රමාණය අනුව ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට එක් කිලෝමීටරයක් සඳහා<br>iv- නාගරික බල ප්‍රදේශයට අයත් නොවේ නම් දුර ප්‍රමාණය අනුව ට්‍රැක්ටරය බර පටවා නොගෙන යාමට එක් කිලෝමීටරයක් සඳහා<br>v- පාසල් , ආගමික ස්ථාන , අවමගුල් කටයුතු (පොදු කටයුතු ) සඳහා කාර්මික නිලධාරි නිර්දේශය හා අධීක්ෂණය මත ගාස්තුවෙන් නිදහස් අතර ඒ සඳහා ප්‍රවාහන වියදම් දැරිය යුතු ය. | 5850.00<br>5850.00<br>250.00<br>200.00 |
| 03 | **ගලි බවුසරය**<br>i- ගලි බවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ (නිවාස,ආගමික ස්ථානයක්,රාජ්‍ය ආයතනයක් සඳහා)<br>ii- අමතර ගමන් වාරයක් සඳහා<br>iii- ව්‍යාපාරික ස්ථාන සඳහා<br>iv- අමතර ගමන් වාරයක් සඳහා ව්‍යාපාරික ස්ථාන සඳහා<br>v- ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර නිවාස සඳහා<br>vi- ගලිබවුසරය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර අමතර ගමන් වාරයක් සඳහා (නිවාසයක් සඳහා)<br>vii- ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර ගමන් වාරයක් සඳහා ව්‍යාපාරික ස්ථාන සඳහා<br>viii- ව්‍යාපාරික ස්ථාන අමතර ගමන් වාරයකට<br>ix- නගර සීමා ප්‍රදේශයට අයත් නොවේ නම් එක් කිලෝමීටරයක් සඳහා | 5850.00<br>2000.00<br>6850.00<br>3000.00<br>11700.00<br>6000.00<br>15200.00<br>7500.00<br>250.00 |
| 04 | **බැකෝ යන්ත්‍රය**<br>I. පෞද්ගලික කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට ඉන්ධන සහිතව<br>II. පෞද්ගලික කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට - ඉන්ධන රහිතව | 5500.00<br>2500.00 |

| | | |
|---|---|---|
| 05 | **ට්‍රේලරය සමඟ ට්‍රැක්ටරය කුලියට දීම**<br><br>I- දිනකට ඉන්ධන රහිතව | 5000.00 |
| 06 | **පුස්තකාල සේවා**<br>**සාමාජික අයදුම්පත්‍රයක් සඳහා**<br><br>I- පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි)<br>II- පුස්තකාල සාමාජික ගාස්තු (ළමා)<br>III- පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට එක් පොතක් සඳහා | 20.00<br><br>100.00<br>50.00<br>5.00 |
| 07 | **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සේවා ගාස්තු**<br><br>I- ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන් කිරිමේ ගාස්තු පැය 12ක<br><br>II- ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන් කිරිමේ ගාස්තු පැය 6කට<br><br>III- කුඩ ආවරණයක් සඳහා දිනකට<br><br>IV- සුළු පරිමාණ ව්‍යාපාර සඳහා ස්ථාන වෙන් කිරිමේ ගාස්තු පැය 12ක | 10000.00<br><br>5000.00<br><br>1000.00<br><br>1000.00 |
| 08 | **සුසාන භූමි**<br>I- මෘත දේහ භූමදානය කිරිම සඳහා ඕනෑම වයස් බාණ්ඩයකට නිදහස්ය<br>II- තැන්පත් කිරිම<br>වාර්ෂිකව පවත්වාගෙන යාම සඳහා<br>III- ස්මාරක ඉදිකිරිමට | -<br><br>25000.00<br>5000.00<br>10000.00 |
| 09 | **තාවකාලික බලපත්‍රයක් මත යම් විශේෂ උත්සව අවස්ථාවකට අදාලව,**<br><br>**(අදාල ඉල්ලුම්පත්‍රය රු. 50.00 ක මුද්දරයක් සහිතව ඉදිරිපත් කළ යුතුය )**<br>ගවයෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්තු<br>එළුවෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්ත | <br><br><br>5000.00<br>2500.00 |
| 10 | **වෙනත්**<br>I- කැනපිහටි එකක් සඳහා<br>II- GI බටයක් සඳහා<br>III- ප්ලාස්ටික් පුටු එකක් සඳහා | 500.00<br>10.00<br>10.00<br>25.00 |

| | | |
|---|---|---|
| | IV- කොඩි කණුවක් සඳහා<br>V- කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් තොග වශයෙන් ලබාගන්නේ නම්<br>VI- කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 හෝ 100 අඩුවෙන් ලබාගන්නේ නම්<br>VII- සංචාරක වෙළඳාම ( වාහන මඟින් )<br>VIII- තාවකාලික වෙළඳකුටි සඳහා වාර්ෂිකව<br>IX- පාපැදි බලපත්‍ර සඳහා අයකරනු ලබන ගාස්තු<br>X- පාපැදි අයදුම්පත්‍ර ගාස්තු<br>XI- ජල නළ එළීමට මාර්ගය පලුදු කිරීම සඳහා නැවත නොගෙවන ගාස්තු | 12.00<br>15.00<br>1500.00<br>1500.00<br>15.00<br>10.00<br>500.00 |
| 11 | I- වීථි රේඛා ගාස්තු<br>II- ගොඩනැඟිලි අයදුම්පත් ගාස්තු<br>III- වීථි රේඛා / පිඹුරුපත් අයදුම්පත්‍ර ගාස්තු<br>IV- වරිපනම් /අක්කර බදු /උඩෘත සහ සහතික<br>V- වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ගාස්තු (සභා තීරණය මත )<br>VI- පිඹුරුපත් අනුමත කිරීම / අනු බෙදුම් සඳහා අවසර දීම එක් කට්ටලයක් සඳහා<br>VII- ගොඩනැඟිලි සැලසුම් සඳහා පෙරසැරි ගාස්තු (නාගරික සීමාවෙන් බාහිර ප්‍රදේශ සඳහා වර්ග අඩියකට )<br>නේවාසික ස්ථාන (නව ඉදිකිරීම් )<br>ව්‍යාපාර ස්ථාන (නව ඉදිකිරීම්)<br>අතිරේක ගාස්තු ( දැනටමත් ඉදිකර ඇති ඉදිකිරීම්)<br><br>VIII- අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ( ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ)<br>IX- නිර්වන්දි ගිවිසුම<br>X- ගොඩනැගිලි සැලසුම් පිටපතක් සහතික කිරීම සඳහා සේවා ගාස්තු<br>XI- ඉඩම් කට්ටි කර විකිණීමේ දී කට්ටි සැලසුම් අනුමත කිරීම - ඉඩම් අනුබෙදුම් පර් එකක් සඳහා<br>XII- මායිම් තාප්ප ( පැනි බැමි ) මීටර් 01 ක් සඳහා<br>XIII- වෙළඳ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු | 1500.00<br>500.00<br>25.00<br>500.00<br>200.00<br><br>500.00<br><br><br>500.00<br><br>2.00<br>5.00<br>3.00<br><br><br>3000.00<br>1000.00<br>300.00<br><br>300.00<br><br><br>35.00<br>50.00 |

සපයනු ලබන සේවාවන් යටතේ කාබනික පොහොර අලෙවිය 2023 වර්ෂය සඳහා ප්‍රවර්ධනය කරගෙන පවත්වාගෙන යාම සිදු කළ යුතු හෙයින්

කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් රු.12.00

තොග වශයෙන් ලබාගන්නේ නම්

කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 හෝ රු.15.00

100 අඩුවෙන් ලබාගන්නේ නම්

ලෙස සංශෝධනය විය යුතු බව හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

**2023 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ සඳහා 2023 වර්ෂයට අදාලව හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සඳහා එකී උපලේඛනයේ ( ii ) තිරුවේ අනුප්‍රමාණික ගාස්තුවක් අය කිරීම නියම කළ යුතු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උප ලේඛන**

| **අනු අංකය** | **විස්තරය** | **ii තීරුව (රු. ශත)** |
|---|---|---|
| 01 | **ප්‍රධාන ක්‍රීඩාංගණය වෙන් කිරීම** | |
| | vii- වාණිජ කටයුතු සඳහා දිනකට | 10,000.00 |
| | viii- පොදු කටයුතු | 2000.00 |
| | ix- පාසැල් හෝ ළදරු පාසැල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම | - |
| | **සභාව සතු වෙනත් ක්‍රීඩාංගණ වෙන් කිරීම** | |
| | x- වාණිජ කටයුතු සඳහා දිනකට | 2500.00 |
| | xi- පොදු කටයුතු | 1000.00 |
| | xii- පාසැල් හෝ ළදරු පාසැල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම | - |
| 02 | **ජල බවුසරය** | |
| | vi- ජල බවුසරය නගර සීමාව තුළ ජලය රහිතව (දිනකට) | 5850.00 |
| | vii- ජල බවුසරය නගර සිමාවෙන් පිටත | 5850.00 |
| | viii- නාගරික බල ප්‍රදේශයට අයත් නොවේ නම් දුර ප්‍රමාණය අනුව ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට එක් කිලෝමීටරයක් සඳහා | 250.00 |
| | ix- නාගරික බල ප්‍රදේශයට අයත් නොවේ නම් දුර ප්‍රමාණය අනුව ට්‍රැක්ටරය බර පටවා නොගෙන යාමට | 200.00 |

| | | |
|---|---|---|
| | එක් කිලෝමීටරයක් සඳහා<br>x- පාසල් , ආගමික ස්ථාන , අවමගුල් කටයුතු (පොදු කටයුතු ) සඳහා කාර්මික නිලධාරී නිර්දේශය හා අධීක්ෂණය මත ගාස්තුවෙන් නිදහස් අතර ඒ සඳහා ප්‍රවාහන වියදම් දැරිය යුතු ය. | |
| 03 | **ගලි බවුසරය**<br>x- ගලි බවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල (නිවාස,ආගමික ස්ථානයක්,රාජ්‍ය ආයතනයක් සඳහා)<br>xi- අමතර ගමන් වාරයක් සඳහා<br>xii- ව්‍යාපාරික ස්ථාන සදහා<br>xiii- අමතර ගමන් වාරයක් සඳහා ව්‍යාපාරික ස්ථාන සදහා<br>xiv- ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර නිවාස සදහා<br>xv- ගලිබවුසරය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර අමතර ගමන් වාරයක් සඳහා (නිවාසයක් සදහා)<br>xvi- ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් බැහැර ගමන් වාරයක් සඳහා ව්‍යාපාරික ස්ථාන සදහා<br>xvii- ව්‍යාපාරික ස්ථාන අමතර ගමන් වාරයකට<br>xviii- නගර සීමා ප්‍රදේශයට අයත් නොවේ නම් එක් කිලෝමීටරයක් සඳහා | 5850.00<br>2000.00<br>6850.00<br>3000.00<br>11700.00<br>6000.00<br>15200.00<br>7500.00<br>250.00 |
| 04 | **බැකෝ යන්ත්‍රය**<br>III. පෞද්ගලික කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට ඉන්ධන සහිතව<br>IV. පෞද්ගලික කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට - ඉන්ධන රහිතව | 5500.00<br>2500.00 |
| 05 | **ට්‍රේලරය සමඟ ට්‍රැක්ටරය කුලියට දීම**<br>J- දිනකට ඉන්ධන රහිතව | 5000.00 |
| 06 | **පුස්තකාල සේවා**<br>**සාමාජික අයදුම්පත්‍රයක් සඳහා** | 20.00 |

| | | |
|---|---|---|
| | IV- පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි)<br>V- පුස්තකාල සාමාජික ගාස්තු (ළමා)<br>VI- පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට එක් පොතක් සඳහා | 100.00<br>50.00<br>5.00 |
| 07 | **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සේවා ගාස්තු**<br>V- ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන් කිරීමේ ගාස්තු පැය 12ක<br>VI- ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන් කිරීමේ ගාස්තු පැය 6කට<br>VII- කුඩ ආවරණයක් සඳහා දිනකට<br>VIII- සුළු පරිමාණ ව්‍යාපාර සඳහා ස්ථාන වෙන් කිරීමේ ගාස්තු පැය 12ක | 10000.00<br>5000.00<br>1000.00<br>1000.00 |
| 08 | **සුසාන භූමි**<br>IV- මෘත දේහ භූමදානය කිරීම සඳහා ඕනෑම වයස් බාණ්ඩයකට නිදහස්ය<br>V- තැන්පත් කිරීම<br>වාර්ෂිකව පවත්වාගෙන යාම සඳහා<br>VI- ස්මාරක ඉදිකිරීමට | -<br>25000.00<br>5000.00<br>10000.00 |
| 09 | **තාවකාලික බලපත්‍රයක් මත යම් විශේෂ උත්සව අවස්ථාවකට අදාලව,**<br>**(අදාල ඉල්ලුම්පත්‍රය රු. 50.00 ක මුද්දරයක් සහිතව ඉදිරිපත් කළ යුතුය )**<br>ගවයෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්තු<br>එළුවෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්තු | 5000.00<br>2500.00 |
| 10 | **වෙනත්**<br>XII- කැනපිහට් එකක් සඳහා<br>XIII- GI බටයක් සඳහා<br>XIV- ප්ලාස්ටික් පුටු එකක් සඳහා<br>XV- කොඩි කණුවක් සඳහා<br>XVI- කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් තොග වශයෙන් ලබාගන්නේ නම්<br>XVII- කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100 හෝ 100 අඩුවෙන් ලබාගන්නේ නම්<br>XVIII- සංචාරක වෙළඳාම ( වාහන මඟින් ) | 500.00<br>10.00<br>10.00<br>25.00<br>12.00<br>15.00<br>1500.00 |

| | | | |
|---|---|---|---|
| | XIX- | තාවකාලික වෙළදකුටි සඳහා වාර්ෂිකව | 1500.00 |
| | XX- | පාපැදි බලපත්‍ර සඳහා අයකරනු ලබන ගාස්තු | 15.00 |
| | XXI- | පාපැදි අයදුම්පත්‍ර ගාස්තු | 10.00 |
| | XXII- | ජල නළ එළීමට මාර්ගය පලුදු කිරීම සඳහා නැවත නොගෙවන ගාස්තු | 500.00 |
| 11 | XIV- | වීථි රේඛා ගාස්තු | 1500.00 |
| | XV- | ගොඩනැඟිලි අයදුම්පත් ගාස්තු | 500.00 |
| | XVI- | වීථි රේඛා / පිඹුරුපත් අයදුම්පත්‍ර ගාස්තු | 25.00 |
| | XVII- | වරිපනම් /අක්කර බදු /උඩෘත සහ සහතික | 500.00 |
| | XVIII- | වරිපනම් ලේඛණයේ නම වෙනස් කිරීමේ ගාස්තු (සභා තිරණය මත ) | 200.00 |
| | XIX- | පිඹුරුපත් අනුමත කිරීම / අනු බෙදුම් සඳහා අවසර දීම එක් කට්ටලයක් සඳහා | 500.00 |
| | XX- | ගොඩනැඟිලි සැලසුම් සඳහා පෙරසැරි ගාස්තු (නාගරික සිමාවෙන් බාහිර ප්‍රදේශ සඳහා වර්ග අඩියකට ) | 500.00 |
| | | නේවාසික ස්ථාන (නව ඉදිකිරීම් ) | 2.00 |
| | | ව්‍යාපාර ස්ථාන (නව ඉදිකිරීම්) | 5.00 |
| | | අතිරේක ගාස්තු ( දැනටමත් ඉදිකර ඇති ඉදිකිරීම්) | 3.00 |
| | XXI- | අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ( ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ) | 3000.00 |
| | XXII- | නිර්වන්දි ගිවිසුම | 1000.00 |
| | XXIII- | ගොඩනැගිලි සැලසුම් පිටපතක් සහතික කිරීම සඳහා සේවා ගාස්තු | 300.00 |
| | XXIV- | ඉඩම් කට්ටි කර විකිණීමේ දී කට්ටි සැලසුම් අනුමත කිරීම - ඉඩම් අනුබෙදුම් පර් එකක් සඳහා | 300.00 |
| | XXV- | මායිම් තාප්ප ( පැති බැමි ) මීටර් 01 ක් සඳහා | 35.00 |
| | XXVI- | වෙළද බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු | 50.00 |

සපයනු ලබන සේවාවන් යටතේ කාබනික පොහොර අලෙවිය 2023 වර්ෂය සඳහා ප්‍රවර්ධනය කරගෙන පවත්වාගෙන යාම සිදු කළ යුතු හෙයින්

කොම්පෝස්ට් පොහොර කිලෝ ග්රෑම් 100 ට වැඩියෙන් තොග වශයෙන් ලබාගන්නේ නම් — රු.12.00

කොම්පෝස්ට් පොහොර කිලෝ ග්රෑම් 100 හෝ 100 අඩුවෙන් ලබාගන්නේ නම් — රු.15.00

ලෙස සංශෝධනය විය යුතු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

**2023 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම.**

1988 අංක 56 හා 2000 අංක 53 අංක දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වන දින සිට මෙහි උප ලේඛනයේ " ඇ"කොටසෙ හි නිශ්චිතව සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 2264/18 සහ 2022 ජනවාරි මස 27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතින් පනවන ලද රෙගුලාසි වලට අනුව පහත උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් උපලේඛන අංක I හි අනුප්‍රමාණික බලපත්‍ර ගාස්තු ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු බව හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛන I**

| **ආයෝජන** | **පරීක්ෂණ කිරීමේ ගාස්තුව ( උපරිම )** |
|---|---|
| රු 250000.00 හෝ ඊට අඩු | රු. 3000.00 |
| රු. 250001.00 – 500000.00 දක්වා | රු. 3750.00 |
| රු. 500001.00 – 1000000.00 | රු. 5000.00 |
| රු. 1000000.00 ට වැඩි | රු. 10000.00 |
| වසර 3ක් හෝ ඊට අඩු කාලයක් සඳහා නිකුත් කරනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | රු. 4500.00 |

**උපලේඛන II**

"ඇ" කොටස

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලෝන්ඩ්‍රි)

4. රෙදි වියන යන්ත්‍ර / මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
5. දිනකට ලීටර 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
6. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10ක් කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
7. දිනකට ලීටර 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදන කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්ත.
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ / මුහුවම් කිරීමේ කර්මාන්ත.
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්.
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්.

    මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + (50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව)+10 x(එළුවන් සංඛ්‍යාව))

20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.

24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින '"ප්ලාස්ටර් ඔෆ් පැරිස් 'අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තක්
25. බෙලිකටු කැබලි කිරීමේ / පතුරු කිරීමේ කර්මාන්ත.
26. උළු සහ ගඩොල් පෝරණු.
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු.
30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මොල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත.
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන බඩු කර්මාන්ත.
33. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම් , නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත.
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා.
39. මෙම උපලේඛනයේ "ඇ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් / කර්මාන්තයක්.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී. මහේන්ද්‍රන් මහතා</u>

<u>විවාද</u>

**2023 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම.**

1988 අංක 56 හා 2000 අංක 53 අංක දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වන දින සිට මෙහි උප ලේඛනයේ " ඇ"කොටසෙ හි නිශ්චිතව සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත

සම්බන්ධයෙන් අංක 2264/18 සහ 2022 ජනවාරි මස 27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතින් පනවන ලද රෙගුලාසි වලට අනුව පහත උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් උපලේඛන අංක I හි අනුප්‍රමාණික බලපත්‍ර ගාස්තු ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛන I**

| **ආයෝජන** | **පරික්ෂණ කිරීමේ ගාස්තුව ( උපරිම )** |
|---|---|
| රු 250000.00 හෝ ඊට අඩු | රු 3000.00 |
| රු 250001.00 – 500000.00 දක්වා | රු 3750.00 |
| රු 500001.00 – 1000000.00 | රු 5000.00 |
| රු 1000000.00 ට වැඩි | රු 10000.00 |
| වසර 3ක් හෝ ඊට අඩු කාලයක් සඳහා නිකුත් කරනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | රු 4500.00 |

**උපලේඛන II**

"ඇ" කොටස

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලෝන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර / මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
5. දිනකට ලීටර 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
6. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10ක් කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
7. දිනකට ලීටර 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදන කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්ත.
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.

12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ / මුහුවම් කිරීමේ කර්මාන්ත.
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්.
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්.

    මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + (50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව)+10 x(එළුවන් සංඛ්‍යාව))

20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින '''ප්ලාස්ටර් ඔෆ් පැරිස් 'අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ / පතුරු කිරීමේ කර්මාන්ත.
26. උළු සහ ගඩොල් පෝරණු.
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පිය කැණීම් කටයුතු.
30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මොල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත.
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන බඩු කර්මාන්ත.
33. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්ගල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම් , නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්න.
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා.
39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුලත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් / කර්මාන්තයක්.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 13**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

**2023 වර්ෂය සඳහා රථ වාහන නවතා තැබීමේ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 22, 122, 126 වගන්තිය යටතේ හපුතලේ ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2002.08.02 දිනැති අංක 1248 දරණ ගැසට් නිවේදනය මඟින් පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛණ සඳහන් ගාස්තු අය කළ යුතු බවට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛන**

| **වාහන නැවතුම් ගාස්තු :-** | **රු. ශත** |
|---|---|
| (අ) ත්‍රී රෝද රථයක් සඳහා පැයකට | 50.00 |
| (පැයකට වඩා වැඩි වූ විට ) | 100.00 |
| (ආ) මෝටර් රථයක්, වෑන් රථයක් සඳහා පැයකට | 100.00 |
| ( පැයකට වඩා වැඩිවූ විට) | 200.00 |
| (ඇ) බස් රථයක් , මෝටර් කොච් රථයක් , ලොරියක් හෝ | |
| ට්‍රැක්ටරයටක් සඳහා පැය 02 ක | 100.00 |
| ( පැය 2 කට වඩා වැඩි වූ විට පැයක් සඳහා ) | 100.00 |

**පොදු නවතා තැබීමේ ස්ථාන භාවිතා කිරිම සඳහා මාසික ගාස්තුව :-**
**රු.ශත**

| | |
|---|---|
| (අ) ත්‍රීවිල් රථ සඳහා (නගර සීමා) | 250.00 |
| (ආ) වෑන්,ලොරි,රථ සඳහා ( නගර සීමා) | 250.00 |
| (ඇ) ත්‍රීවිල් රථ සදහා (නගර සීමාවෙන් පිටත) | 150.00 |

එසේම හපුතල ප්‍රාදේශීය සභාවේ 2002-08-02 දිනැති අංක 1248 යටතේ ප්‍රකාශයට පත් කර ඇති ගැසට් නිවේදනයේ පොදු නවතා තැබීමේ ගාස්තු නියම කිරීම යටතේ අය කරනු ලබන මුදලට වඩා වැඩි මුදලක් ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර පැවතියද ගැසට් කරන ලද වසරේ සිටම අය කිරීම කරනු ලබන්නේ මෙම යෝජනාවේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් වන හෙයින් 2023 වර්ෂයටත් එම ගාස්තු ප්‍රමාණයම අය කිරීම සුදුසු බවට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය.

විවාද

**2023 වර්ෂය සඳහා රථ වාහන නවතා තැබීමේ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 22, 122, 126 වගන්තිය යටතේ හපුතලේ ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2002.08.02 දිනැති අංක 1248 දරණ ගැසට් නිවේදනය මඟින් පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛණ සඳහන් ගාස්තු අය කළ යුතු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛන**

| **වාහන නැවතුම් ගාස්තු :-** | **රු. ශත** |
|---|---|
| (අ) ත්‍රී රෝද රථයක් සඳහා පැයකට | 50.00 |
| (පැයකට වඩා වැඩි වූ විට ) | 100.00 |
| (ආ) මෝටර් රථයක්, වෑන් රථයක් සඳහා පැයකට | 100.00 |
| ( පැයකට වඩා වැඩිවූ විට) | 200.00 |
| (ඇ) බස් රථයක් , මෝටර් කොච් රථයක් , ලොරියක් හෝ | |
| ට්‍රැක්ටරයටක් සඳහා පැය 02 ක | 100.00 |
| ( පැය 2 කට වඩා වැඩි වූ විට පැයක් සඳහා ) | 100.00 |

**පොදු නවතා තැබීමේ ස්ථාන භාවිතා කිරීම සඳහා මාසික ගාස්තුව :-**
**රු.ශත**

| | |
|---|---|
| (අ) ත්‍රීවිල් රථ සඳහා (නගර සීමා) | 250.00 |
| (ආ) වෑන්,ලොරි,රථ සඳහා ( නගර සීමා) | 250.00 |
| (ඇ) ත්‍රීවිල් රථ සදහා (නගර සීමාවෙන් පිටත) | 150.00 |

එසේම හපුතල ප්‍රාදේශීය සභාවේ 2002-08-02 දිනැති අංක 1248 යටතේ ප්‍රකාශයට පත් කර ඇති ගැසට් නිවේදනයේ පොදු නවතා තැබීමේ ගාස්තු නියම කිරීම යටතේ අය කරනු ලබන මුදලට වඩා වැඩි මුදලක් ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර පැවතියද ගැසට් කරන ලද වසරේ සිටම අය කිරීම කරනු ලබන්නේ මෙම යෝජනාවේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් වන හෙයින් 2023 වර්ෂයටත් එම ගාස්තු ප්‍රමාණයම අය කිරීම සුදුසු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.
ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 14**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

**2023 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් සහ සතුන් පිළිබඳ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උප වගන්තයෙ හි විධි විධාන ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතක හෝ ඒ අවට දිගේලිකර හෝ අයාලේ යන ගවයින් , මී ගවයින් , එළුවන් ආදි සතුන්ගෙන් ප්‍රදේශයේ ජනතාවට සහ දේපල වලට විශාල වශයෙන් හානි පැමිණෙන බැවින් එම ආපදාවන් වැළැක්වීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උප වගන්තයෙ හි විධි විධාන පරිදි ක්‍රියා කිරිමේ දි අල්ලා ගනු ලබන සතුන් සඳහා හා එකි සතුන් , නිදහස් කර ගැනිම සඳහා පහත උපලේඛණයේ සඳහන් ගාස්තු අයකළ යුතු බවට හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| | |
|---|---|
| 01. ගවයෙකු , මී ගවයෙකු, එළුවකු හෝ ඌරෙකු ඇල්ලීමේ ගාස්තුව | රු. 1000.00 |
| 02. එම සතුන් නඩත්තු කිරිමේ ගාස්තු | රු. 500.00 |

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

**2023 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් සහ සතුන් පිළිබඳ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උප වගන්තයෙ හි විධි විධාන ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතක හෝ ඒ අවට දිගේලිකර හෝ අයාලේ

යන ගවයින් , මී ගවයින් , එළුවන් ආදි සතුන්ගෙන් ප්‍රදේශයේ ජනතාවට සහ දේපල වලට විශාල වශයෙන් හානි පැමිණෙන බැවින් එම ආපදාවන් වැළැක්වීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උප වගන්තයෙ හි විධි විධාන පරිදි ක්‍රියා කිරීමේ දී අල්ලා ගනු ලබන සතුන් සඳහා හා එකි සතුන් , නිදහස් කර ගැනිම සඳහා පහත උපලේඛණයේ සඳහන් ගාස්තු අයකළ යුතු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛනය**

01. ගවයෙකු , මී ගවයෙකු, එළුවකු හෝ ඌරෙකු ඇල්ලීමේ ගාස්තුව රු. 1000.00
02. එම සතුන් නඩත්තු කිරීමේ ගාස්තු රු. 500.00

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 15**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

**2023 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 22,122(1) 126 වන වගන්ති මඟින් පැවිරි ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාව විසින් පිළිගෙන ඇති අංක 1816/43 හා 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව 13 වැය කොටස මඟින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරිම ,පාලනය කිරිම හා ඒ සඳහා ගාස්තු අය කිරිම සම්බන්ධයෙන් පවරා ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පහත උපලේඛනය I කොටසින් නිරූපිත පරිශ්‍රයන් හෝ එකි උපලේඛනයේ II වන කොටසක් අනුප්‍රමාණික ගාස්තුවක් කසළ ගාස්තු ලෙස පනවා අය කළ යුතු බව හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

**එකතු කරනු ලබන කසළ ගාස්තු ප්‍රමාණය :-**

| **ආයතනය මඟින් දිනකට පළාත් පාලන ආයතනය වෙත ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය** | **මසකට අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය (රුපියල් ශත)** |
|---|---|
| කිලෝ 0 ත් - කිලෝ 5 ත් අතර | ගාස්තු අය නොකළ යුතුය |
| කිලෝ 5 ත් - කිලෝ 10 ත් අතර | 150.00 |
| කිලෝ 10 ත් - කිලෝ 20 ත් අතර | 400.00 |
| කිලෝ 20 ත් - කිලෝ 30 ත් අතර | 600.00 |

| | |
|---|---|
| කිලෝ 30 ත් - කිලෝ 50 ත් අතර | 1000.00 |
| කිලෝ 50 ත් - කිලෝ 100 ත් අතර | 2000.00 |
| කිලෝ 100 ත් - කිලෝ 150 ත් අතර | 3000.00 |
| කිලෝ 150 ත් - කිලෝ 200 ත් අතර | 4000.00 |
| කිලෝ 200 ත් - කිලෝ 300 ත් අතර | 6000.00 |
| කිලෝ 300 ට වැඩි | 7500.00 |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

**2023 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 22,122(1) 126 වන වගන්ති මඟින් පැවිරි ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාව විසින් පිළිගෙන ඇති අංක 1816/43 හා 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව 13 වැය කොටස මඟින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරිම ,පාලනය කිරිම හා ඒ සඳහා ගාස්තු අය කිරිම සම්බන්ධයෙන් පවරා ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පහත උපලේඛනය I කොටසින් නිරූපිත පරිශ්‍රයන් හෝ එකි උපලේඛනයේ II වන කොටසක් අනුප්‍රමාණික ගාස්තුවක් කසළ ගාස්තු ලෙස පනවා අය කළ යුතු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

**උපලේඛනය**

**එකතු කරනු ලබන කසළ ගාස්තු ප්‍රමාණය :-**

| **ආයතනය මඟින් දිනකට පළාත් පාලන ආයතනය වෙත ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය** | **මසකට අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය (රුපියල් ශත)** |
|---|---|
| කිලෝ 0 ත් - කිලෝ 5 ත් අතර | ගාස්තු අය නොකළ යුතුය |
| කිලෝ 5 ත් - කිලෝ 10 ත් අතර | 150.00 |
| කිලෝ 10 ත් - කිලෝ 20 ත් අතර | 400.00 |
| කිලෝ 20 ත් - කිලෝ 30 ත් අතර | 600.00 |
| කිලෝ 30 ත් - කිලෝ 50 ත් අතර | 1000.00 |
| කිලෝ 50 ත් - කිලෝ 100 ත් අතර | 2000.00 |
| කිලෝ 100 ත් - කිලෝ 150 ත් අතර | 3000.00 |
| කිලෝ 150 ත් - කිලෝ 200 ත් අතර | 4000.00 |

| | |
|---|---|
| කිලෝ 200 ත් - කිලෝ 300 ත් අතර | 6000.00 |
| කිලෝ 300 ට වැඩි | 7500.00 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 16**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම.

1984 අංක 24 දරණ විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා එකී පනත මගින් හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ II වන වගන්තියේ I වන උප වගන්තිය ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන විනෝද කටයුතු වශයෙන් ගැනෙන ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර පවත්වනු ලබන සංදර්ශනයක් සෑම චිත්‍රපට දර්ශනයක් , ආදර්ශ චිත්‍රපට දර්ශනයක් , මැජික් දර්ශනයක් ,සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් 2023 වර්ෂයට පනවා අය කළ යුතු යැයි හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

තවද පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL /07/9/2/4 හා 2021-02-25 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතන විසින් චිත්‍රපටි ශාලා වලින් අය කරනු ලබන විනෝද බද්ද වසර 2ක් යනතුරු අය නොකරන ලෙස දැනුම් දී ඇති හෙයින් ඒ අනුව 2023 වර්ෂයේ මාර්තු මාසය දක්වා විනෝද බදු වශයෙන් 6.15 අය විෂය යටතේ ආදායම් ඇස්තමේන්තු නොකිරීම සුදුසු බව. හපුතල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම.

1984 අංක 24 දරණ විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා එකී පනත මගින් හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ II වන වගන්තියේ I වන උප වගන්තිය ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන විනෝද කටයුතු වශයෙන් ගැනෙන ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර පවත්වනු ලබන සංදර්ශනයක් සෑම චිත්‍රපට දර්ශනයක් , ආදර්ශ චිත්‍රපට දර්ශනයක් , මැජික් දර්ශනයක් ,සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහා නිකුත්

කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් 2023 වර්ෂයට පනවා අය කළ යුතු යැයි ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

තවද පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL /07/9/2/4 හා 2021-02-25 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතන විසින් චිත්‍රපටි ශාලා වලින් අය කරනු ලබන විනෝද බද්ද වසර 2ක් යනතුරු අය නොකරන ලෙස දැනුම් දී ඇති හෙයින් ඒ අනුව 2023 වර්ෂයේ මාර්තු මාසය දක්වා විනෝද බදු වශයෙන් 6.15 අය විෂය යටතේ ආදායම් ඇස්තමේන්තු නොකිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 17

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

අංක 2199/25 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 10(2) (ආ) ඡේදයේ සදහන් පරිදි කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට අවස්ථාව සලසා දෙනු ලබන බවට වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් පුවත් පත් දෙකක භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීම කළ යුතු හෙයින් දැන්වීම් සඳහා වැයවන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

අංක 2199/25 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 10(2) (ආ) ඡේදයේ සදහන් පරිදි කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට අවස්ථාව සලසා දෙනු ලබන බවට වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් පුවත් පත් දෙකක භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීම කළ යුතු හෙයින් දැන්වීම් සඳහා වැයවන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 18

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

මිනින්දෝරු අධිකාරිගේ අ.ග.පි.193 හි කැබලි අංක 1058 වශයෙන් මැන වෙන් කරන ලද 64 සී රංපල්ලාව ග්‍රාම නිලධාරි වසමේ මැණික් කන්ද ක්‍රීඩා පිටිය හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

මිනින්දෝරු අධිකාරිගේ අ.ග.පි.193 හි කැබලි අංක 1058 වශයෙන් මැන වෙන් කරන ලද 64 සී රංජල්ලාව ග්‍රාම නිලධාරි වසමේ මැණික් කන්ද ක්‍රීඩා පිටිය හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 19

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2018 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව අනුව ඒකක 735ක් ලෙස දක්වා ඇති වරිපනම් ඒකක ප්‍රමාණය මේ වන විට සත්‍ය වශයෙන්ම වර්ධනය වී ඇති බැවින් ආදායම් පරීක්ෂක , කාර්මික නිලධාරි ඇතුලු කමිටුවක් හරහා සමීක්ෂණයක් සිදු කර නැවත තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරුවක් සිදු කර පනත ප්‍රකාරව අදාළ විධිමත් ක්‍රමවේද අනුගමනය කර වරිපනම් සීමාව පුළුල් කිරීම සුදුසු බවත් එසේම වරිපනම් සීමාව පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා

විවාද

2018 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව අනුව ඒකක 735ක් ලෙස දක්වා ඇති වරිපනම් ඒකක ප්‍රමාණය මේ වන විට සත්‍ය වශයෙන්ම වර්ධනය වී ඇති බැවින් ආදායම් පරීක්ෂක , කාර්මික නිලධාරි ඇතුලු කමිටුවක් හරහා සමීක්ෂණයක් සිදු කර නැවත තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරුවක් සිදු කර පනත ප්‍රකාරව අදාළ විධිමත් ක්‍රමවේද අනුගමනය කර වරිපනම් සීමාව පුළුල් කිරීම සුදුසු බවත් එසේම වරිපනම් සීමාව පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 20

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - ඌව පළාත මගින් ලද අංක LDSP/UVA/PC/2021 අංක දරණ 2022-07-18 දිනැති ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම යන යෝජනාව ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමා සමඟ 2022-07-11 වන දින පැවති

සාකච්ඡාවේ දී සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම , සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීමට අදාළව පවතින නඩත්තු කටයුතු සතුටුදායක නොවීම , සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම සඳහා පවතින ආයතන සංඛ්‍යාව සීමා සහිත ප්‍රමාණයක් වීම හා වර්තමානයේ පවතින ආනයන සීමා කිරීම යන කරුණු හේතුවෙන් යෝග්‍ය නොවන බවට තීරණය වූ අතර ඒ වෙනුවෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොදු වෙළඳපොළ හි පොළ භූමිය වැඩි දියුණු කිරීම යන යෝජනාව සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ගැනීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - ඌව පළාත මගින් ලද අංක LDSP/UVA/PC/2021 අංක දරණ 2022-07-18 දිනැති ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම යන යෝජනාව ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමා සමඟ 2022-07-11 වන දින පැවති සාකච්ඡාවේ දී සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම , සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීමට අදාළව පවතින නඩත්තු කටයුතු සතුටුදායක නොවීම , සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම සඳහා පවතින ආයතන සංඛ්‍යාව සීමා සහිත ප්‍රමාණයක් වීම හා වර්තමානයේ පවතින ආනයන සීමා කිරීම යන කරුණු හේතුවෙන් යෝග්‍ය නොවන බවට තීරණය වූ අතර ඒ වෙනුවෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොදු වෙළඳපොළ හි පොළ භූමිය වැඩි දියුණු කිරීම යන යෝජනාව සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ගැනීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ප්‍රසම්පාදන කමිටුව ලෙස පහත සාමාජිකයින් තෝරා පත් කර ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 01 | ප්‍රසම්පාදන කමිටු සභාපති | ගරු සභාපති | බී.කන්දසාමි මහතා |
| 02 | සාමාජිකයින් | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඩී. සුදත් අරුණ රංජන මහතා |
| | | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා |
| | | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්. සගාදේවන් මහතා |
| 03 | කාර්ය මණ්ඩල නියෝජනයන් | සභා ලේකම් | කේ.එම්.පී.සී. කුලසේකර මිය |
| | | ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි | කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතා |
| 04 | පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් නම් කරන නියෝජනයන් | | එල්.ආර්.ඩී.එම්.එස්.යූ. බණ්ඩාර හල්පේ මහතා |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 21**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 දිස්ත්‍රික් කමිටු රැස්වීමේ දී සඳහන් කළ පරිදි වර්තමාන ඉන්ධන මිල ගණන් හා සැසදීමේ දී ජල බවුසරය සඳහා නගර සීමාව තුළ මේ වන විට  අය කරන ගාස්තුව වන රු.3000.00ත් රු.4000.00ත් අතර මිල රු.11,700.00 ලෙස සංශෝධනය විය යුතු බවත් නගර සීමාවෙන් පිටතදී ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට කි.මී. 01ක් සඳහා රු.250.00ක් ද බර පටවා නොගෙන කි.මී. 01ක් සඳහා රු.200.00 ලෙසත් සංශෝධනය කිරීම සඳහා කාර්මික නිලධාරි මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එකී මිල ගණන් යටතේ ඇති රු.11,700.00 ක මිල පැය 8 කට යැයි සලකා ජල බවුසරය ලබා දීමට ගත වන කාලය පැය 04ක් ලෙස තීරණය කර ඒ සඳහා අය කළ යුතු මුදල රු.5850.00ක් ලෙස තීරණය කිරීම සුදුසු බවත් ඊට අමතරව බල ප්‍රදේශයෙන් බැහැරට යන අවස්ථාවලදී ප්‍රවාහන වියදම් ලෙස ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට කි.මී. 01ක් සඳහා රු.250.00ක් ද බර පටවා නොගෙන කි.මී. 01ක් සඳහා රු.200.00 ලෙසත් තීරණය කර මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන  මහතා

විවාද

2022 දිස්ත්‍රික් කමිටු රැස්වීමේ දී සඳහන් කළ පරිදි වර්තමාන ඉන්ධන මිල ගණන් හා සැසදීමේ දී ජල බවුසරය සඳහා නගර සීමාව තුළ මේ වන විට  අය කරන ගාස්තුව වන රු.3000.00ත් රු.4000.00ත් අතර මිල රු.11,700.00 ලෙස සංශෝධනය විය යුතු බවත් නගර සීමාවෙන් පිටතදී ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට කි.මී. 01ක් සඳහා රු.250.00ක් ද බර පටවා නොගෙන කි.මී. 01ක් සඳහා රු.200.00 ලෙසත් සංශෝධනය කිරීම සඳහා කාර්මික නිලධාරි මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එකී මිල ගණන් යටතේ ඇති රු.11,700.00 ක මිල පැය 8 කට යැයි සලකා ජල බවුසරය ලබා දීමට ගත වන කාලය පැය 04ක් ලෙස තීරණය කර ඒ සඳහා අය කළ යුතු මුදල රු.5850.00ක් ලෙස තීරණය කිරීම සුදුසු බවත් ඊට අමතරව බල ප්‍රදේශයෙන් බැහැරට යන අවස්ථාවලදී ප්‍රවාහන වියදම් ලෙස ට්‍රැක්ටරය බර පටවාගෙන යාමට කි.මී. 01ක් සඳහා රු.250.00ක් ද බර පටවා නොගෙන කි.මී. 01ක් සඳහා රු.200.00 ලෙසත් තීරණය කර මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 22**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

සී/ස ප්‍රගති කෘෂි නිෂ්පාදන අලෙවිකරුවන්ගේ සංගමයේ බදු ගිවිසුම් කාල සීමාව 2022-09-30 වන දිනෙන් අවසන් වන බැවින් එහි බදු ගිවිසුම තවත් වසරකින් දීර්ඝ කිරීම හා මාසිකව ගෙවිය යුතු බදු මුදල ලෙස රු.21,000.00ක මුදලම මාස්පතා අය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

සී/ස ප්‍රගති කෘෂි නිෂ්පාදන අලෙවිකරුවන්ගේ සංගමයේ බදු ගිවිසුම් කාල සීමාව 2022-09-30 වන දිනෙන් අවසන් වන බැවින් එහි බදු ගිවිසුම තවත් වසරකින් දීර්ඝ කිරීම හා මාසිකව ගෙවිය යුතු බදු මුදල ලෙස රු.21,000.00ක මුදලම මාස්පතා අය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 23**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි 2022-07-12 වන දින පැවති මහ සභා වාරයේ දී යෝජනා අංක 02 යටතේ ඉදිරිපත් කරන ලද හපුතලේ ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම මත ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව නැවත සංශෝධන කර මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි 2022-07-12 වන දින පැවති මහ සභා වාරයේ දී යෝජනා අංක 02 යටතේ ඉදිරිපත් කරන ලද හපුතලේ ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම මත ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව නැවත සංශෝධන කර මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 24**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභා සීමව තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන අනුව ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම, ඉඩම් අනුබෙදුම් කර විකිණීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව  සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභා සීමව තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන අනුව ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම, ඉඩම් අනුබෙදුම් කර විකිණීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව  සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 25**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් අභිනවයෙන් ඉදි කරන ලද පොළ භූමියේ ඇති ගොඩනැගිල්ලට හා පොළ භූමිය සඳහා ජලය සපයනු ලැබීමට මාපක අංක දරණ 2105043156 ජල මීටරය සවි කර ඇති අතර 2022-02-13 දින සිට අදාළ භූමිය හා ගොඩනැගිල්ල අප ආයතනය වෙත විධිමත් පරිදි භාර දී ඇති අතර එදින සිට 2022-08-07 දක්වා පරිභෝජනය කරන ලද ජලය වෙනුවෙන් ගාස්තු ලෙස රු.12,753.54 ක එක් බිල්පතක් ලැබී ඇත.ඒ අනුව මීට අදාළ ගාස්තුව ගොඩනැගිල්ල පරිහරණය කරනු ලබන දියතලාව පොලිස් ස්ථානය වන හෙයින් මෙම බිල්පත එම ආයතනයෙන් ගෙවීම් කළ යුතු බව දැනුම් දී ලිපි යොමු කිරීමත් ඉතා කඩිනමින් පොළ භූමිය සඳහා හා ගොඩනැගිල්ල සඳහා වෙන වෙනම මීටර් සවි කිරීමට ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් අභිනවයෙන් ඉදි කරන ලද පොළ භූමියේ ඇති ගොඩනැගිල්ලට හා පොළ භූමිය සඳහා ජලය සපයනු ලැබීමට මාපක අංක දරණ 2105043156 ජල මීටරය සවි කර ඇති අතර 2022-02-13 දින සිට අදාළ භූමිය හා ගොඩනැගිල්ල අප ආයතනය වෙත විධිමත් පරිදි භාර දී ඇති අතර එදින සිට 2022-08-07 දක්වා පරිභෝජනය කරන ලද ජලය වෙනුවෙන් ගාස්තු ලෙස රු.12,753.54 ක එක් බිල්පතක් ලැබී ඇත.ඒ අනුව මීට අදාළ ගාස්තුව ගොඩනැගිල්ල පරිහරණය කරනු ලබන දියතලාව පොලිස් ස්ථානය වන හෙයින් මෙම බිල්පත එම ආයතනයෙන් ගෙවීම් කළ යුතු බව දැනුම් දී ලිපි යොමු කිරීමත් ඉතා කඩිනමින් පොළ භූමිය සඳහා හා

ගොඩනැගිල්ල සඳහා වෙන වෙනම මීටර් සවි කිරීමට ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර 2022-08-07 දක්වා පරිභෝජනය කරන ලද ජලය වෙනුවෙන් ගාස්තු ලෙස රු.12,753.54 ක බිල්පත සභා අරමුදලින් ගෙවීම ට ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### යෝජනා අංක 26

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 ඔක්තෝබර් මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

2022 ඔක්තෝබර් මස මහ සභාව පැවැත්වෙන දිනය 2022-10-14 වන දිනය ලෙස තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### යෝජනා අංක 27

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු පොළ බදු හා වාහන බදු සඳහා ඇති ගිවිසුම 2022.10.06 දිනෙන් අවසන් වීම හේතුවෙන් දෛනික ගාස්තුව රු.2060.00 යටතේ මිල කැඳවීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු පොළ බදු හා වාහන බදු සඳහා ඇති ගිවිසුම 2022.10.06 දිනෙන් අවසන් වීම හේතුවෙන් දෛනික ගාස්තුව රු.2060.00 යටතේ මිල කැඳවීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.09.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා විසින් ගෙවීම් වාර්තාවේ අංක 22 යටතේ සඳහන් දුරකථන දීමනාව රු.19,000.00ක් ලෙස සඳහන් වී තිබීම නිවැරදි නොවන බව ප්‍රකාශ කරන ලදී ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයෙහි සභිකයන් 16 දෙනෙකුහට රු.1000.00 බැගින් රු.16000.00ක් හා ගරු උප සභාපතිතුමන් වෙත රු.3000.00 ක් ලෙස සම්පූර්ණ මන්ත්‍රී දීමනාව රු.19000.00ක් ලෙස ගෙවීම් වාර්තාවේ සඳහන් වටිනාකම නිවැරදි බව පැහැදිලි කරන ලද අතර 2022.09.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2022 අගෝස්තු මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 08.වෙනත් කරුණු

### 08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු

නැත

### <u>08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒම්.විමලසිරි මහතා අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන ලද ප්‍රජා සේවා අතුරින් වීථි පහන් සවි කිරීම ඉතාම වටිනා කටයුත්තක් බවත් මෙකී වීථි පහන් හේතුවෙන් ප්‍රදේශයේ සිදු වූ විවිධ අක්‍රමිකතා මේ වන විට නතර වූ බවත් එනිසා තවදුරටත් සවි කිරීමට නියමිත වීථි පහන් සවි කිරීමට අවශ්‍ය පියවර ගන්නාමෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.එසේම බල ප්‍රදේශය තුළ සිදු වන වැලි ප්‍රවාහන කටයුතු හේතුවෙන් ගම් සභා මාර්ග ඉතා ඉක්මනින් අබලන් වන බැවින් මාර්ගය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් 2022-09-04 වන දින පැවති ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති සමඟ පැවති සාකච්ඡාවේ දී තීරණය වූ පරිදි හපුතලේ සභාව විසින් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර ග්‍රාමීය අලෙවිසැල් හි අලෙවි කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසත් ඒ සඳහා ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාරප්පන් කන්දසාමි මහතා අදහස් දක්වමින් හපුතලේ සිට දඹේතැන්න ලිප්ටන් ශිට් දක්වා මාර්ගය කාපට් යොදවා සෑදීම සඳහා මුල් ගල් තබා කටයුතු මේ වන විට ආරම්භ කර තිබුණ ද කුමන හෝ හේතුවක් මත මේ වන විට කිලෝ මීටර 2 ½ ක් පමණ ඒබීසී යොදවා සකස් කර ඇති හෙයින් එකී මාර්ගයේ ගමනා ගමනය සිදු කරන ප්‍රජාව බොහෝ අපහසුතාවයට ලක් වී ඇති බවත් පාසල් ළමුන් මාර්ගය දූවිලි සහිත බැවින් අසනීපයට ලක් වන බැවින් එකී මාර්ගයෙහි ඉතිරි කොටස කාපට් යොදවන ලෙස ප්‍රකාශ කරන ලදී.
එසේම මාවුස්සාකැලේ,ඩියගල හා බණ්ඩාරඑළිය යන වතු ආශ්‍රිත ප්‍රදේශ සඳහා වීථි ලාම්පු සවි කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.

එසේම දඹේතැන්න වත්තෙ හි 17,18, හා 19 ලැයිම් කාමර අසල හා ග්‍රාම නිලධාරි කාර්යාලය අසල වැසිකිළි වළ පිරී ඒ අසළ කානුවකට යාම සම්බන්ධයෙන් ප්‍රජාවට සිදු වන අපහසුතාවය පිලිබඳව සඳහන් කරමින් මේ වන විට වතු අධිකාරි දැනුවත් කර ලිපි 05ක් පමණ යොමු කර ඇති අතර මේ වන තුරු ඒ සම්බන්ධයෙන් නිසි විසඳුමක් ලැබී නොමැති බැවින් තවදුරටත් මේ සම්බන්ධයෙන් වතු අධිකාරීතුමන් දැනුවත් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.
ලංකෙම් සමාගම සතු ආගරපතන වැවිලි සමාගමේ සේවයේ නියුතුව සිට මේ වන විට විශ්‍රාම ලබා සිටින කම්කරුවන් හට මේ වන තෙක් වසර 03 ක් පුරා සේවක අර්ථ සාධක අරමුදල් නොලැබීම සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධව සොයා බලා අදාල ප්‍රතිලාභ කම්කරුවන් හට ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ආගරපතන වැවිලි සමාගමේ කලමණාකාරීත්වය දැනුවත් කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙකී මාර්ගය කාපට් යෙදවීමට අවශ්‍ය කටයුතු නැවත සිදු කරන ලෙසත්, කිලෝ මීටර 2 ½ ක් පමණ ඒබීසී යොදවා ඇති කොටසට තාර යොදවන ලෙසත් , තාර පැච් යොදා මෙකී මාර්ගය කඩිනමින් සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් 2022-08-09 වන දින පැවති මහ සභා වාරයේ දී වතු ක්ෂේත්‍රයේ නියුතු කම්කරුවන් විශ්‍රාම යාමේ දී ඔවුන්ට හිමි සේවක අර්ථ සාධක අරමුදල් ලබා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් කම්කරු කාර්යාලයේ දී සිදු වන අපහසුතාවයන් පිළිබඳ අදහස් ප්‍රකාශ කරන ලද අතර හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2022-08-09 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධයෙන් කරුණු විමසීම් කර වතු කම්කරුවන්ගේ රාජකාරී කටයුතු ඉටු කර ගැනීම පහසු කිරීම සඳහා කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් වෙත ස්තූතිය ප්‍රකාශ කරන ලදී.
එසේ ම සභාව මැදිහත් වී හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වතු ආශ්‍රිත ප්‍රදේශයන් හි පොදු ස්ථානවල වැවී ඇති වල් ඉවත් කිරීම සඳහා තණ කොළ කපන මැෂිම සමඟ මාර්ග කම්කරුවන් මසකට වරක් ලබා දීමට කටයුතු කරන ලෙසත් , ග්ලැනනෝර් වතු යායේ මාර්ගය මේ වන විට කිලෝ මීටර 2 ක පමණ ප්‍රමාණයක් කාපට් කර ඇති අතර මාර්ගයේ ඉතිරිව පවතින කොටසෙ හි පවතින අඩුපාඩු සකස් කර දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසත් වතු ආශ්‍රිත ප්‍රදේශයන් හි වීථි ලාම්පු සවි කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
වතු කම්කරුවන් මේ වන විට ඉතා පීඩිත තත්ත්වයට පත් වී ඇති බවත් ප්‍රධාන වශයෙන් ලංකාවට ඩොලර් උපයා දෙන ප්‍රමුඛ පිරිසක් වන වතු කම්කරුවන් ගේ දෛනික වැටුප ජීවන වියදමට නොසෑහෙන බැවින් මේ වන විට ගෙවනු ලබන දෛනික වැටුප වැඩි කර දෙන ලෙස අදාල වැවිලි සමාගම් 22හි කලමනාකාරීත්වය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.
දෙවැනි වතාවටත් ඉන්දියන් රජය මගින් ලබා දුන් ආධාර යටතේ ලද සහල් කිලෝ ග්රෑම් 10ක ප්‍රමාණය ලබා දීම පිළිබඳ තමිල්නාඩු මහ ඇමති ගරු ස්ටාලින් මහතා වෙත තම ස්තූතිය ප්‍රකාශ කරන බවත්,මේ සම්බන්ධයෙන් කැපවීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා කම්කරු කොන්ග්‍රස් පක්ෂයේ නායක ගරු අමාත්‍ය සෙන්දිල් තොන්ඩමන් මහතා ඇතුළු සියලුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.
පවතින ආර්ථිකය සමඟ වතු ප්‍රජාව විශාල වශයෙන් අඩුපාඩු සම්බන්ධයෙන් මුහුණ දෙන බැවින් වත්මන් ආණ්ඩුව හමුවේ වතු ප්‍රජාව වෙත සහන ලබා දීම සඳහා ගරු ජනාධිපතිතුමන්ගේ හා ගරු අගමැතිතුමන්ගේ අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් වීථි පහන් සවි කිරීමේ දී ඒවා විදුලි බල මණ්ඩලයේ විදුලි කනු සඳහා සවි කිරීමට අවසර ලබා නොදෙන්නේ නම් එකී වීථි පහන් පොදු ස්ථානවලට හෝ ලබා දීමට ගරු සභිකයන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ප්‍රකාශ කළ අතර, ප්‍රජාව විසින් දොඩම්වත්ත සුසාන භූමියට කසළ ගෙනවිත් දමන බැවින් ඒවා වැළැක්වීම සඳහා සභාව විසින් පුවරු සවි කිරීම සිදු කරන ලෙසත් ,දියතලාව මහ විද්‍යාලයේ ක්‍රීඩාංගනය සකස් කිරීමේ දී පස් මාර්ගයට සේදී යාම නිසා දොඩම්වත්ත මාර්ගය භාවිතා කිරීමට නොහැකි තත්ත්වයට පත් වී ඇති බවත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දියතලාව මහ විද්‍යාලයේ ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් ගොඩනැගිලි ඉංජිනේරුතුමන් ඇතුලු පිරිසක් සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත් අවශ්‍ය පියවර ගැනීම සඳහා මේ වන විට යොමු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී පී. වයලට් රෝස් මහත්මිය අදහස් දක්වමින් තොටලාගල වත්තෙ හි වෙසෙන ඇතැම් පිරිස් විසින් සමෘද්ධි සහනාධාරය , කූපන් හා පින්පඩි යන ආධාර වර්ග තුනම ලබාගන්නා ඇතැම් පිරිස් සිටින බවත්, ඇතැම් පිරිස් හට මෙම කිසිම ආධාරයක් නොලැබෙන පිරිස් සිටින බවත් එය අසාධාරණ ක්‍රමවේදයක් බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා ආධාර නොලැබෙන පිරිස් සඳහා යම් කිසි එක් ආධාරයක් හෝ ලබාදීමට ප්‍රාදේශීය ලේකම්තුමන් දැනුවත් කිරිමට අවශ්‍ය කටයුතු සළසා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී වී. එලීල් අරසි මහත්මිය අදහස් දක්වමින් පිටරත්මලේ සමෘද්ධිලාභී වතු ප්‍රජාව විසින් රුපියල් 500.00 ක මුදලක් රැස්වීමේ දී ලබා ගත් බවට අසත්‍ය ප්‍රචාරයක් පැතිරී ගිය ද සමිතියෙහි සේවය කරනු ලබන සභාපති , ලේකම් හා භාණ්ඩාගාරික යන සියලු දෙනා සේවය කරනුයේ වැටුප් රහිතව හා එසේ සමෘද්ධිලාභී වතු ප්‍රජාව විසින් මුදල් ගෙවීම සිදු කරනුයේ නම් අදාල නිලධාරීන් හට පමණක් මුදල් ගෙවීම සිදු කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සගාදේවන් මහතා නැවතත් අදහස් දක්වමින් වතුකරයේ වෙසෙන පිරිස් සමෘද්ධි සහනාධාර ලබාගැනීමේදී දැඩි අපහසුතාවයට මුහුණපාන බවත්, බොහෝ විට වතුකරයේ විශාල ප්‍රජාවක් එකම අවස්ථාවේ රාජකාරී ඉටු කර ගැනීම සඳහා පිවිසෙන බැවින් කිසිදු ක්‍රමානුකූලභාවයක් නොමැතිබවත් සමෘද්ධි හිමි වතු ප්‍රජාව සඳහා එම සමෘද්ධි ආධාර ලබා දීමට යම් පහසු ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ගල්කන්ද රක්ෂිතයට අදාල ප්‍රදේශයට කුණු ගෙනවිත් දැමීම සිදු කරන බවත් ඊට පහත ප්‍රදේශයේ බීමට ජලය ලබා ගන්නා ස්ථාන පවා ඇති බැවින් කුනු ගෙනවිත් දැමීම තහනම් කරමින් පුවරුවක් සවි කිරීමට කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් 1992 වර්ෂයේ ගරු සෞම්‍ය මූර්ති තොණ්ඩමන් මහතා විසින් කඳුකර සිසුන් අධ්‍යාපනය ලබා ඉහළ මට්ටමකට යායුතු යැයි සිතමින් ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යාලය ( Collage Of Edu ) නිර්මාණය කරන ලද බවත් ආරම්භයේ දී වතු කම්කරුවන්ගේ ළමුන් සඳහා මූලිකත්වය ලබා දුන් අතර කාලයත් සමඟ කඳුකර සිසුන් බඳවා ගැනීම් ප්‍රමාණය විශාල ලෙස අඩු වී ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් ගරු සෙන්දිල් තොණ්ඩමාන් මහතා විසින් පසු ගිය 17 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ කඳුකර ළමුන් අධික වශයෙන් බඳවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කරන ලදී.මේ සම්බන්ධයෙන් ගරු සෙන්දිල් තොණ්ඩමාන් මහතා හට තම ස්තුතිය ප්‍රකාශ කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි

හපුතාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වශයෙන් ද්‍රවිඩ ගරු මන්ත්‍රීවරුන් සිටින අතර මෙම බල ප්‍රදේශයෙ හි මෙම වසරේ සිටින උසස් පෙළ විභාගය සමත් වූ හොඳ ප්‍රතිඵල ලබා සිටින ළමුන් ඇගයීම සඳහා උත්සවයක් සංවිධානය කිරීමට ඉදිරි කටයුතු සූදානම් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

මා ඇතුළු ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා සහ ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී කන්දසාමි මහතාද යම් වැඩකටයුත්තක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිය අවස්ථාවක දී එහි පළමු වතාවට ඉන්දියන් රජය මගින් ලබා දුන් සහල් (කිලෝ ග්‍රෑම් 60 මිටි ) , පිටි (කිලෝ ග්‍රෑම් 10 මිටි ) 06, ක් භාවිතයට නොගෙන නාස්ති වී ඇති බව නිරීක්ෂණය විය.ප්‍රජාවට සහනාධාර මත හිමිවන සහල් ලබා දීමට පොරොත්තු ලේඛනය හා යම් ලියකියවිලි අවශ්‍ය වන බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශ කරන බවත් , එසේ නම් ලියකියවිලි නොමැති අය සඳහා අවශ්‍ය ලේඛන සැදීම ඔවුන්ගේ වගකීම බවත් නාස්තියට ලක් වන සහල් හා පිටි එසේ නාස්ති වීමට ඉඩ නොතබා බෙදා හැරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම්දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී.කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.